**ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 02 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 857.14 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 750.97 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 106.17 ක් හෙවත් සියයට 12.39 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 522.19 | 512.29 | 9.90 | 1.90 |
| මූලධන | 334.95 | 238.68 | 96.27 | 28.74 |
| **එකතුව** | **857.14** | **750.97** | **106.17** | **12.39** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 23.00 | 22.99 | 9.50 | 13.41 | 70.00 | 58.17 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 44.93 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0054/000 | 0.13 |
| 6000/0000/00/0013/0026/000 | 5.03 |
| 6000/0000/00/0016/0005/000 | 39.77 |
| එකතුව | **44.93** |

**2.4 විගණන නිරීක්ෂණය**

-----------------------

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

-------------------------------------------------

**3.1 අග්‍රිම ගිණුම්**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 46 කදී නිකුත් කර තිබුණු එකතුව රු.698,415 ක තත්කාර්ය අතුරු අග්‍රිමවලින් වියදම් නොකර ඉතිරි වූ එකතුව රු.244,630 ක් ප්‍රමාද කර නිරවුල් කර තිබුණි.

(ආ) අවස්ථා 03 කදී ලබා ගෙන තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම දින 06 ක සිට දින 65 ක් දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර මුදලින් පියවා තිබුණි.

(ඇ) 2016 මුල් මාස 06 තුළ අවස්ථා 21 කදී නිකුත් කර තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිමයන් සඳහා අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. මේ නිසා ලබා ගෙන තිබුණු අතුරු අග්‍රිමවලින් අදාළ කාර්ය ඉටු කළ පසු ඉතිරිය ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 20 ක සිට සියයට 73 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ 2016 ජනවාරි 07 දිනැති අංක 2/2016 දරන කාර්යාල නියෝගයේ 2.6 උප වගන්තිය අනුව ලද අත්තිකාරම් මුදල ඇස්තමේන්තුවට අනුව වියදම් කළ යුතු වුවද, ඇස්තමේන්තු ගත මුදලට සාපේක්ෂව වියදම් සියයට 28 ක සිට සියයට 170 ක් දක්වා වැඩි වූ අවස්ථා 12 ක් අනාවරණය විය.

**3.2 පොදු තැන්පත් ගිණුම**

------------------------

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 5,574,630 ක්වූ තැන්පතු 45 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------

විෂය අංක 20601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.306,411 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් පාලන ගිණුමේ හර ශේෂය අතර රු.96,391 ක වෙනසක් අනාවරණය වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම වෙනසින් රු.3,600 ක් සඳහා පමණක් හේතු පැහැදිලි කර තිබුණි. ඒ අනුව තවත් රු.92,761 ක වෙනස සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සසඳා නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව පැවත එන රු.444,761 ක නොසැසඳෙන ශේෂයක් පැවතුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව සසඳා නිවැරදි කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.4 අභ්‍යන්තර විගණනය

2011 ජූලි 28 දින සිට අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණ ද, 2017 දෙසැම්බර් 31 දින වන විටත්, එම තනතුර පුරප්පාඩුව පැවතුණි. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් දෙපාර්තමේන්තුවේ විගණනයක් සිදුකර 2016 වර්ෂයේදී අභ්‍යන්තර විගණන විමසුම් 03 ක් පමණක් නිකුත් කර තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ජාතික කලාභවනට නිකුත් කර තිබූ රු.85,833 ක් වටිනා මැපර් ඩ්‍රම් සෙට් එකක් වර්ෂ 08 ක කාලයක සිට අභාවිතව පැවතුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2015 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

## 3.6 බේරුම් නොකළ බැරකම්

2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 කට අඩු කාලයක සිට පැවැත එන රු.මිලියන 27.54 ක් වූ බැරකම් පැවැතුණි.

**3.7 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | මුදල් රෙගුලාසි 104 හා 105 | | ජාතික කලාභවන වෙත නිකුත් කර තිබූ GT-10 ගිටාර් පැඩලයක් 2011 වර්ෂයේ සිටද, සංගීත භාණ්ඩ හා උපකරණ අයිතම් 12 ක් 2001 වර්ෂයේ සිටද, ඌනව පැවතුණද මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | **අමාත්‍ය මණ්ඩල තීරණ** | | |
| | 2004 මැයි 12 දිනැති අංක 04/0427/020/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | 211,688 | රාජ්‍ය ආයතනයන්හි සියලු දැන්වීම් රාජ්‍ය මුද්‍රිත මාධ්‍ය ආයතනයන් මඟින් සිදුකර ගත යුතු වුවද, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ රාජ්‍ය ළමා නාට්‍ය උළෙල වෙනුවෙන් පුවත්පත් දැන්වීම් 5ක් පෞද්ගලික මුද්‍රිත මාධ්‍යවල පළකර ගෙවීම් කර තිබුණි. |

**3.8 කාර්යසාධනය**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) කලායතන ශිල්පී සංචිතය පිහිටුවීම පිළිබඳ ව්‍යාපෘති වාර්තාව අනුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් එක් එක් දිස්ත්‍රික්කය සඳහා ශිල්පීන් 54 ක නර්තන වාදන සංචිතයක් ගොඩනැගීම එහි ප්‍රධාන අරමුණ වී තිබුණි. එමෙන්ම දිස්ත්‍රික් මට්ටමින් තෝරාගත් ශිල්පීන්ගෙන් සැදුමලත් 1000ක ජාතික නර්තන සංචිතය ගොඩනැගීම ද අරමුණු කරගෙන තිබුණි. 2012 වර්ෂයේ ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතිය 2017 ඔක්තෝබර් මාසය වන විට අක්‍රීයව පැවති අතර ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොලැබීම ඊට ප්‍රධාන හේතුව බව සංස්කෘතික අධ්‍යක්ෂවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ii) 2016 වර්ෂය අවසානයේ මහාවංශ vi භාණ්ඩය සම්පාදනය (1978-2010) වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 5.32 ක් ඉතිරි කර තිබූ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 47 ක පමණ අඩු මට්ටමක පැවැතුණි.

(iii) ජෝන්ද සිල්වා සමරු රඟහල නවීකරණය කිරීමේ කටයුතු 2011 වර්ෂයේ සිට ආරම්භකර තිබුණු අතර 2016 ජනවාරි 25 දිනට සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 1,289 ක් විය. ඉදිකිරීම් අදියර දෙකකින් නිමකළ යුතුව තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 385.96 ක් වැය කර තිබුණි. ඒ අනුව පළමු අදියරෙහි භෞතික ප්‍රගතිය සියයට 81 ක් වූ අතර, දෙවන අදියර ආරම්භ කර නොතිබුණි. රඟහල නවීකරණය කිරීමේ කටයුතුවල දැඩි ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

## 3.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට නිකුත් කර තිබුණු නමුත්, බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 06 කට වැඩි කල් ගතවී තිබුණු රු.777,834 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට පැවති හඳුනා නොගත් ලැබීම් රු.5,900 ක් හා හඳුනා නොගත් ගෙවීම් එකතුව රු.22,391ක් වී තිබුණත්, එම ලැබීම් හා ගෙවීම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ ගැලපීම් කර නිවැරදි කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මාලාවේ iii වන පරිච්ඡේදයේ 27 වන වගන්තියේ විධිවිධානවලට පටහැනිව අනුමත සේවක සංඛ්‍යාව තුළ ඇතුළත් නොවූ "පුහුණු උපදේශක" නම් වූ තනතුරක් සඳහා බඳවාගත් පුද්ගලයෙකුට 2014, 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු.25,000 ක්, රු.233,051 ක් හා රු.192,248 ක් වශයෙන් එකතුව රු.450,299 ක දීමනා ගෙවා තිබුණි.

## 3.11 අනාර්ජික ගනුදෙනු

විශ්වකෝෂ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2007 ජනවාරි මාසයේ සිට මාසිකව රු.260,000කට කුලී පදනම මත ලබාගෙන තිබූ වර්ග අඩි 3653ක ගොඩනැගිල්ලේ වර්ග අඩි 1198 ක පමණ ඉඩ ප්‍රමාණයක් 2015 වර්ෂයේ සිට 2017 ඔක්තෝබර් මාසය දක්වා ඌන උපයෝජිතව පැවතුණි.

## 3.12 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවලින් පෙන්වා දුන් ඌනතාවයන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු අවස්ථා පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 3.12(අ) සහ (ආ) | මහාවංශ කාර්යාලයේ සම්බන්ධීකාරක විසින් 2014 වර්ෂයේ දී සම්පාදක මණ්ඩල රැස්වීම් සඳහා දීමනා ගෙවීම වෙනුවෙන් ලබාගත් රු.70,000 ක අත්තිකාරම් මුදල් දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂගේ රියදුරුගේ ලංකා බැංකු පෞද්ගලික ගිණුමට බැරකර තිබුණි. පසුව මහාවංශ කාර්යාලයේ සම්පාදක මණ්ඩල සාමාජිකයින්ගේ නම් ඇතුළත් කර ව්‍යාජ අත්සන් යොදා නම් ලැයිස්තුවක් ඉදිරිපත් කිරීමෙන් අත්තිකාරම් පියවීමට කටයුතු කළ බවට සම්බන්ධීකාරක විසින් 2015 මැයි 25 දින විගණනයට ප්‍රකාශයක් ලබාදී තිබුණි.අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පවත්වා ඉදිරි පියවර ගන්නා බව දැනුම් දී තිබුණ ද විමර්ශන කටයුතුවල දීර්ඝ ප්‍රමාදයක් නිරීක්ෂණය විය. |

## 3.13 කළමනාකරණ දුර්වලතා

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබාගන්නා කලාකරුවන් වෙනුවෙන් 2008 වර්ෂයේදී ආරම්භ කර තිබූ "සරස්වතී" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ නියමිත දිනට වාරික මුදල් ප්‍රේෂණය නොකිරීම, යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා නොතිබීම, විශ්‍රාම වැටුප් වැඩපිළිවෙල නිශ්චිතව ලේඛනගත කර නොතිබීම සහ ප්‍රතිලාභීන් බඳවා ගැනීමට ක්‍රමවේදයන් සකස් කර නොතිබීම යන හේතූන් නිසා ප්‍රතිපාදන ලබා දී නොතිබුණි. දායකත්වය සීමිත කිරීම, වයස් බාණ්ඩ ඉක්මවා යාමෙන් විශ්‍රාම වැටුප් හිමිකම් නොලැබියන පිරිසක් බිහිවීම, ඉහළ ප්‍රතිශතයක් විශ්‍රාම වැටුපට ඇතුළත් කර ගැනීමට නොහැකිවීම යන කරුණු සැලකීමේ දී මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයෙන් කලාකරුවන්ට ලැබිය යුතු ප්‍රතිලාභ ලබාදීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. එමෙන්ම මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව ප්‍රතිපාදන ඌනතාවය බව දක්වා තිබුණි. නමුත් මේ සඳහා නිසි ක්‍රමවේදයක් සකස් නොකිරීම ප්‍රතිපාදන නොලැබීමට හේතුවී තිබුණි. ඉහත කරුණු අනුව මෙය අසාර්ථක වීම කෙරෙහි කළමනාකරණ අකාර්යක්ෂමතාව බලපා තිබූ බව නිරීක්ෂණය විය.

**3.14** මානව සම්පත් කළමනාකරණය

**------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**--------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | **28** | **14** | **14** | **-** |
| (ii) | තෘතියික මට්ටම | **03** | **02** | **01** | **-** |
| (iii) | ද්විතියික මට්ටම | **599** | **538** | **61** | **-** |
| (iv) | ප්‍රාථමික මට්ටම | **87** | **108** | **-** | **21** |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | **82** | **28** | **54** | **-** |
| | **එකතුව** | **799** | **690** | **130** | **21** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ප්‍රාථමික මට්ටම සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 21 දෙනෙකු බඳවා ගෙන වැටුප් හා දීමනා ගෙවා තිබුණත්, ඒ සඳහා අනුමැතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ලබා ගෙන නොතිබුණි.